Extra

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

28984

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

## 8 - ශ්‍රේණිය

## ඉතිහාසය

නම/විභාග අංකය :- ..........................................................................  කාලය : පැය 02යි.

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
- දෙවන කොටසේ ප්‍රශ්න සඳහා පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටස සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ගංගා, කඳුවැටි හා ගිරි දුර්ග ආදියෙන් සමන්විතව ජාතියේ ස්වාධීනත්වය දිගු කලක් ආරක්ෂා කරගත් රාජධානිය වන්නේ,
1. අනුරාධපුර රාජධානිය.
2. මහනුවර රාජධානිය.
3. කෝට්ටේ රාජධානිය.
4. පොළොන්නරුව රාජධානිය.

(02) 'ත්‍රී සිංහලාධීශ්වර' බවට පත් වීමේ අපේක්ෂාවෙන් පෘතුගීසීන් පන්නා දැමීමට කටයුතු කළ උඩරට රජතුමා කවු ද?
1. පළමු වැනි රාජසිංහ රජු.
2. පළමු වැනි විමලධර්මසූරිය රජු.
3. දෙවැනි රාජසිංහ රජු.
4. දෙවැනි විමලධර්මසූරිය රජු.

(03) මහනුවර රාජධානි සමයේ පැවති චිත්‍ර කලාව සම්බන්ධයෙන් නොගැළපෙන ප්‍රකාශය කුමක් ද ?
1. පත් ඉරු වැනි තීරුවලට බෙදා චිත්‍ර ඇඳීම සිදු විය.
2. වර්ණ සඳහා ශාක ද්‍රව්‍ය යොදාගෙන ඇත.
3. ජාතක කතා තේමා වශයෙන් ගෙන තිබේ.
4. වීර චරිත හා සටන් චිත්‍රයට නඟා ඇත.

(04) වැලිවිට සාමණේර හිමියන්ට රාජගුරු පදවිය ප්‍රදානය කරන ලද්දේ,
1. සෙනරත් රජු විසිනි.
2. ශ්‍රී විජය රාජසිංහ රජු විසිනි.
3. දෙවැනි විමලධර්මසූරිය රජු විසිනි.
4. කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසිනි .

(05) උඩරට රාජධානියේ සිටි මහාධිකාරම්වරුන්ට පැවරුණු ප්‍රධාන රාජකාරිය වන්නේ.
1. රජුට අවශ්‍ය යුද හමුදාව මෙහෙය වීම හා පවත්වාගෙන යෑම.
2. රජුගේ පෞද්ගලික ආරක්ෂාව භාරව කටයුතු කිරීම.
3. තුවක්කු හමුදාව භාරව කටයුතු කිරීම.
4. යුද හමුදාවේ අලි ඇතුන් භාරව කටයුතු කිරීම.

(06) පුනරුදයේ බලපෑමෙන් බිහි වූ කලා ශිල්ප කිපයක් හා ඒවායේ නිර්මාණකරුවන් 'අ' හා 'ආ' තීරුවල දැක්වේ. එම තීරු දෙක නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| 'අ' | | 'ආ' | |
|---|---|---|---|
| 1. | ඇතැන්ස් හි පාසල | A. | ඩොනටෙලෝ |
| 2. | මොනාලිසා | B. | මයිකල් ඇංජලෝ |
| 3. | ශාන්ත ජෝර්ජ් ප්‍රතිමාව | C. | ලියනාඩෝ ඩාවින්චි. |
| 4. | පීටා ප්‍රතිමාව | D. | රෆායල් සැන්ඩි. |

1. CBDA  2. DCAB  3. DABC  4. CBAD

(07) ඉදිරියෙන් ඇති පිංතූරයෙන් දැක්වෙන පුද්ගලයා කවුරුන් ද?



1. ඩෙසි ඩෙරියස් ඉරාස්මස්.
2. ෆ්‍රැන්සිස් බේකන්.
3. නිකලස් කොපර්නිකස්.
4. ගැලිලියෝ ගැලිලි.

(08) යුරෝපයේ දේශ ගවේෂණ ව්‍යාපාරය ආරම්භ වීමට බලපෑ ආසන්නම හේතුව වූයේ,

1. වෙළෙඳ කටයුතු පුළුල් වීමයි.
2. පෘථිවිය ගෝලාකාර බව සොයා ගැනීමයි.
3. කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් අතට පත් වීමයි.
4. විද්‍යාත්මක දියුණුවක් ඇති වීමයි.

(09) වෙළෙඳාම දියුණුවත් සමඟ යුරෝපා රටවල ඇති වූ වෙළෙඳ නගර කිපයක් හා එම නගර පිහිටි රටවල් පහත දැක්වේ. එයින් නොගැළපෙන පිළිතුර කුමක් ද?

1. ඇම්ස්ටර්ඩෑම් - ඕලන්දය.
2. ලිස්බන් - පෘතුගාලය.
3. මැඩ්රිඩ් - එංගලන්තය.
4. පැරිස් - ප්‍රංශය.

(10) පෘතුගීසීන් හා ලන්දේසීන්ගේ පෙරදිග පාලන මධ්‍යස්ථානයන් දෙක පිළිවෙළින් පෙන්වා දී ඇති පිළිතුර වන්නේ,

1. පොන්ඩිචේරි හා කල්කටා ය.
2. බතාවිය හා මද්‍රාසිය ය.
3. ගෝව හා බතාවිය ය.
4. කැලිකට් හා මද්‍රාසිය ය.

(11) ක්‍රි.ව1505 දී පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට ලංකාවේ පැවති රාජ්‍යයන් තුන දැක්වෙන පිළිතුර කුමක් ද?

1. කෝට්ටේ , යාපනය, මඩකලපුව.
2. ත්‍රිකුණාමලය, කන්ද උඩරට, යාපනය.
3. කොළඹ, ගාල්ල,යාපනය.
4. කෝට්ටේ, මහනුවර , යාපනය.

(12) සීතාවක **රාජ්‍යය** වර්ධනය වීමේ උච්චතම අවස්ථාව වන්නේ,

1. පෘතුගීසීන් කොළඹ කොටුවට සීමා කිරීමය.
2. උඩරට **රාජ්‍යය** සීතාවකට ඈඳා ගැනීමය.
3. රයිගම **රාජ්‍යය** ඈඳා ගැනීමය.
4. සීතාවක **රාජ්‍යය** පෘතුගීසීන් නතු වීමය.

(13) පළමුවැනි විමලධර්මසූරිය රජ සමයේ මඩකලපුවට පැමිණි ලන්දේසි ජාතික නාවික කපිතාන්වරයා වූයේ,

1. ජොරිස් වන් ස්පිල්බර්ජන් ය.
2. සී බෝල්ට් ද වාර්ට් ය.
3. ලොරොන්සෝ ද අල්මේදා ය.
4. ජෝන් පිබස් ය.

(14) ලන්දේසි පාලන කටයුතුවල දී අවධානය යොමු කළ ප්‍රධාන ක්ෂේත්‍ර තුන පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

1. ප්‍රාදේශීය පාලනය , අධිකරණය හා අධ්‍යාපනය.
2. වෙළෙඳාම, අධ්‍යාපනය හා යුධ කටයුතු.
3. ප්‍රාදේශීය පාලනය, ආගම හා අධ්‍යාපනය.
4. ආගම, අධිකරණය හා අධ්‍යාපනය.

(15) එංගලන්ත වැසියන් තම අයිතීන් දිනා ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ බලය පුළුල් කර ගැනීමට දැරූ උත්සාහයේ ආරම්භක අවස්ථාව වූයේ,

1. ක්‍රි.ව. 1215 මහා අධිකාරි පත්‍රය අත්සන් කිරීමයි.
2. "පොදු රාජ්‍ය" පාලනය ක්‍රියාත්මක කිරීමයි.
3. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දීමයි.
4. අයිතිවාසිකම් පිළිබඳ පනත ඉදිරිපත් කිරීමයි.


(16) බ්‍රිතාන්‍යයේ ඇති වූ කාර්මික විප්ලවයේ බලපෑමට ලක් වූ ප්‍රධාන ක්ෂේත්‍ර තුන වන්නේ,

1. පේෂ කර්මාන්තය, සන්නිවේදනය, ප්‍රවාහනය.
2. පේෂ කර්මාන්තය , ගල් අඟුරු කර්මාන්තය, යකඩ හා වානේ කර්මාන්තය.
3. ගල් අඟුරු කර්මාන්තය, කෘෂි කර්මාන්තය, ප්‍රවාහනය.
4. යකඩ කර්මාන්තය, වානේ කර්මාන්තය, ගල් අඟුරු කර්මාන්තය.

(17) නිදහස, සමානාත්මතාවය හා සහෝදරත්වය යන සංකල්ප පදනම් කර ගනිමින් මිනිසාගේ අයිතීන් රැකගැනීම සඳහා ඇති වූ විප්ලවය කුමක් ද?

1. ඇමරිකානු නිදහස් සටන. 2. ප්‍රංශ විප්ලවය.
3. රුසියන් විප්ලවය. 4. ඉංග්‍රීසි විප්ලවය

18-20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ලෝක සිතියම උපයෝගී කරගන්න.




(18) කාර්මික විප්ලවය ආරම්භ වූ එංගලන්තය පෙන්වා ඇති අක්ෂරය කුමක්ද?

1. N 2. M 3. E 4. B

(19) D අකුරින් පෙන්වා ඇත්තේ කුමන රට ද?

1. ස්පාඤ්ඤය 2. ඉතාලිය
2. ප්‍රංශය 4. පෘතුගාලය

(20) කොන්ස්තන්තිනෝපලය දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

1. A 2. B 3. C 4. E

## II කොටස

- පළමු වැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(1) ඉතිහාසය විෂයය යටතේ අවසාන වාරය සඳහා කරන ලද ඇගයීම් ක්‍රියාවලිය ඇසුරෙන් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඇගයීම සඳහා කරන ලද්දේ කුමන ක්‍රියාකාරකමක් ද? (ල. 2)
(ii) ඇගයීම සඳහා යොදා ගත් පාඩම් ඒකකය කුමක් ද? (ල. 2)
(iii) ඔබේ කණ්ඩායමට ලැබුණු අනු ඒකකයේ නම ලියන්න. (ල. 2)
(iv) මෙම ක්‍රියාවලියේ දී ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් සඳහන් කරන්න. (ල. 2)
(v) තොරතුරු ලබාගැනීම සඳහා උපයෝගී කරගත් මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න. (ල. 2)
(vi) ඔබ විසින් සකස් කරන ලද එක් ප්‍රශ්නයක් හා එයට අදාළ නිවැරැදි පිළිතුර සඳහන් කරන්න. (ල. 4)
(vii) ඔබ කණ්ඩායම් සාමාජිකයෙකු වශයෙන් කණ්ඩායම තුළ වැඩ කිරීමෙන් ලද අත්දැකීම් දෙකක් ලියන්න. (ල. 2)

(2) (i) උඩරට රාජධානිය හැඳින්වීමට භාවිත කළ වෙනත් නම් දෙකක් සඳහන් කරන්න. (ල. 2)
(ii) පහත සඳහන් විස්තරවලින් හැඳින්වෙන පුද්ගලයින් නම් කරන්න. (ල. 3)

A. උඩරට රාජධානියේ ආරම්භක රජතුමා -
B. උඩරට රාජ්‍යය යටත් කරගත් ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා -
C. දෝන කතිරිනා නමින් හැඳින් වූ උඩරට කුමාරිකාව -


(iii) පළමු වැනි විමලධර්මසූරිය රජුගේ ශාසනික සේවාව පිළිබඳව කරුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 6)

(3) (i) දේශ ගවේෂණ ව්‍යාපාරයට සම්බන්ධ පුද්ගලයන් දෙදෙනකු නම් කරන්න. (ල.2)
(ii) පුනරුද සමයේ දී විද්‍යාත්මක ක්ෂේත්‍රයේ සිදු වූ සොයාගැනීම් තුනක් සඳහන් කරන්න. (ල.3)
(iii) පුනරුදය ඇති වීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල.6)

(4) (i) පෘතුගීසීන් විසින් පෙරදිග ප්‍රදේශවලින් ලබාගත් වෙළෙඳ ද්‍රව්‍ය දෙකක් නම් කරන්න. (ල.2)

(ii) යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න. (ල.3)

(iii) පහත දක්වා ඇති ලංකා සිතියමෙහි A,B,C,D.E,F වශයෙන් දක්වා ඇති ස්ථාන හඳුනාගෙන ඒවායේ නම් පිළිතුරු පත්‍රයේ අනුපිළිවෙළින් සඳහන් කරන්න.




(ල. 6)

(5) (i) කෝට්ටේ රාජධානියේ උතුරු හා දකුණු සීමාවන් ලෙස තිබුණු ගංගා දෙක අනුපිළිවෙළින් නම් කරන්න.

A - උතුරින් B - දකුණින් (ල. 2)

(ii) විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජධානිය බෙදුණු කොටස් තුන සඳහන් කරන්න. (ල. 3)

(iii) පෘතුගීසී පාලනය නිසා රට තුළ ඇති වූ ප්‍රතිඵල දෙකක් විස්තර කරන්න (ල. 6)

(6) (i) ලන්දේසීන් මෙරට ඇති කරන ලද උසාවි වර්ග දෙකක් සඳහන් කරන්න. (ල. 2)

(ii) ලන්දේසින් ප්‍රාදේශීය පාලනය සඳහා ලංකාවේ ඇති කරන ලද කොමාන්ඩරි තුන සඳහන් කරන්න. (ල. 3)

(iii) ලන්දේසි පාලනය නිසා ඇති වූ සමාජ සංස්කෘතික බලපෑම් දෙකක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ල. 6)

(7) (i) කාර්මික විප්ලවයේ ප්‍රතිඵල වශයෙන් බිහි වූ පහත සඳහන් නිර්මාණ බිහි කළ පුද්ගලයන් නම් කරන්න.

A. දුරකථනය B. දුම්රිය ඇන්ජිම (ල. 2)

(ii) කාර්මික විප්ලවය මහා බ්‍රිතාන්‍යයේ ඇති වීමට බලපෑ හේතු තුනක් ලියන්න. (ල. 3)

(iii) කර්මාන්ත දියුණු වීම හේතු කොටගෙන ඇති වූ යහපත් හා අයහපත් ප්‍රතිඵල එක බැගින් විස්තර කරන්න. (ල. 6)